සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளீர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/08/01/වකු

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2024.07.25

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2024/11**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල / බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු / සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන්.**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති වල ලාභ විසර්ජන නව අනුපාත හඳුන්වාදීම.</u>**

01. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති විසින් වාර්ෂික උපයන ලාභය විසර්ජනය කිරීමට හඳුන්වා දී ඇති විසර්ජන ගිණුම් හා විසර්ජන අනුපාතයන් සංශෝධනය කිරීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමණාකරණ මණ්ඩල තීරණ අංක 2024/130/07 මගින් අනුමැතිය ලබා දී ඇත.

02. මෙම නව උපදෙස් 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමටත්, තව ද පසු ගිය වර්ෂ වන 2020, 2021 ,2022 හා 2023 වර්ෂ වලට ද නව විසර්ජන අනුපාතයන් අනුව, විසර්ජනයන් නැවත ගැලපීමටත් අනුමැතිය ලැබී ඇත.

03. සමෘද්ධි ප්‍රජාමූල බැංකු නව විසර්ජනයන් හා අනුපාතයන්

| විසර්ජන ගිණුම් | නව අනුපාතය % |
|---|---|
| රඳවාගත් ලාභ අලාභ ගිණුම | 50% |
| කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුම | 25% |
| පොදු සුභ සාධක අරමුදල් ගිණුම | 5% |
| සේවක දිරි දීමනා ගිණුම | 12% |
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියට වෙන් කළ අරමුදල් ගිණුම | 1% |
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමයට වෙන් කල අරමුදල් ගිණුම | 1% |
| ගොඩනැගිලි සංවර්ධන හා නඩත්තු ගිණුම | 4% |
| සේවක සුභ සාධන හා පුහුණු ගිණුම | 2% |
| | 100% |

04. සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය සඳහා වෙන් කරන ලද 12% සේවක දිරි දීමනාව බෙදා දීම.

| තනතුර | නව අනුපාතය % |
|---|---|
| කළමණාකරු | 12% |
| බැංකු සහකාර කළමණාකරු | 10% |
| අනෙකුත් බැංකු කාර්යය මණ්ඩලය | 22% |
| කලාප සහකාර (ක්ෂේත්‍රගත) | 6% |
| ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය(ග්‍රාම නිළධාරී වසම්) | 50% |
| | 100% |

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General — Tel- 011-2872202, Fax - 011-2889002, E-mail- dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) — 011-2873799, 011-2873996, diradmin@samurdhi.gov.lk, Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant — 011-2869742, 011-2869742, finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) — 011-2889003, 011-2887469, Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office — 0112872202, Hot Line: 011- 2887722

05. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති ලාභ විසර්ජනය හා නව අනුපාතයන්

| විසර්ජන ගිණුම් | නව අනුපාතය % |
|---|---|
| රඳවාගත් ලාභ අලාභ ගිණුම | 50% |
| කොටස්කරුවන්ට ගෙවිය යුතු ලාභාංශ ගිණුම | 2% |
| පොදු සුභ සාධන අරමුදල් ගිණුම | 30% |
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමයට වෙන් කල අරමුදල් ගිණුම | 8% |
| සේවක දිරි දීමනා ගිණුම | 10% |
| | 100% |

06. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කාර්යය මණ්ඩල සඳහා වූ 10% සේවක දිරි දීමනා බෙදා දීම.

| තනතුර | නව අනුපාතය % |
|---|---|
| කළමණාකරු | 18% |
| සහකාර කළමණාකරු | 15% |
| ව්‍යාපෘති කළමණාකරු | 15% |
| අනෙකුත් කාර්යය මණ්ඩලය | 52% |
| | 100% |

07. සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති යම් වර්ෂයක් තුළ අලාභයක් පෙන්නුම් කරන විටක, සමෘද්ධි බැංකු මෙහෙයුම් උපදෙස් අංක 12 ට අනුව, සම්පූර්ණ අලාභය රඳවාගත් ලාභ/ අලාභ ගිණුමට මාරු කිරීමට අදාල ගිණුම් සටහන් තැබිය යුතු ය.

08. විසර්ජනය සඳහා අළුතින් හඳුන්වා දෙන ලද විසර්ජන ගිණුම් සඳහා පොදු ලෙජරයේ නව ගිණුම් ආරම්භ කිරීම හා කේත අංක ලබාදීම ඉදිරියේ දී සිදු කරන බව දන්වමි.

09. 2020, 2021, 2022 හා 2023 වර්ෂ වලට අදාල දැනටමත් සිදු කරන ලද විසර්ජනයන් නැවත නව අනුපාතයට විසර්ජනය කිරීම හා වසා දමන ලද විසර්ජන ගිණුම් වල ඇති අරමුදල් අනිකුත් ගිණුම් වලට මාරු කිරීම සම්බන්ධව පරිගණක මෘදුකාංග හා Mannual සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් හා මගපෙන්වීම ඉදිරියේදී ලබා දෙන බැවින්, එතෙක් නව ගැලපීම් සිදු කිරීම නොකල යුතු බව දන්වමි.

10. 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සකස් කර විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වාර්තා සඳහා අනුමැතිය හා විසර්ජන ලාභය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව ද කඩිනමින් උපදෙස් ලබා දෙන බවට ද දැනුම් දෙමි.

සී.ඩී කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-
.01 ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
02. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
04. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. -දැ.ස.හා අ.ක.ස.
05. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
06. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
07. සමෘද්ධි මහා සංගමය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය - කා.දැ.ගැ.ස.